# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023

# ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

# වැය ශීර්ෂ අංකය 311

5 වන මහල, 1 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල
දු.අ.-0112872054/0112887164
ෆැක්ස්- 0112872061/0112872048
ඊ මේල්-**info@nppd.gov.lk**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........................................................ 2

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම.................................................................................... 7

03 පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ... 15

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක ..................................................................................... 37

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ............................... 37

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ.................................................................................. 39

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ..................................................................................... 41

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්ම සැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනා ගනිමින් ද පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් ඵලදායී ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු නගර හා සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලී ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම සිදු කරයි.

ඊට අමතරව ලංකාවේ ප්‍රධාන පූජාභූමිවල විධිමත් සංවර්ධනය උදෙසා වින්‍යාස සැලසුම් සැකසීමත්, ඊට අනුරූපීව ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, එම ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර දීමත් සිදු කරමින් ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදය සඳහා ද විශාල දායකත්වයක් ලබා දේ.

ඉහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අතිමහත්ය.

මෙම කර්තව්‍යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන කලාපීය භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශ සාමූහිකව කැප වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු"

මෙහෙවර

" ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම"

අරමුණු

1. ශ්‍රී ලංකාවේ සැලසුම්ගත තිරසාර හා සොඳුරු භෞතික සංවර්ධනයක් අරමුණු කරගෙන, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම්කරණයක යෙදීම.
3. භෞතික සංවර්ධනයන් සැලසුම් කිරීම සඳහා ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විශ්වාසනීය හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

i. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම
ii. ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම
iii. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික නිර්මාණ නියමු උපදෙස් සකස් කිරීම.
iv. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයාට යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ එවැනි සැලැස්මක් පිළියෙල කරන ලෙස ඒ බලධරයා විසින් ඉල්ලා සිටි විට එවැනි යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීම.
v. කලාපීය භෞතික සැලසුම් පිළියෙල කිරීමේ දී සහ සංවර්ධනය කිරීමේ දී පළාත් සභාවලට සහාය වීම.
vi. ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස, ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
vii. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය, ජාතික භෞතික සැලැස්ම සහ ක්‍රියාත්මකව පවතිමින් තිබෙන ජාතික භෞතික සැලසුම් ක්‍රමෝපාය වරින් වර සමාලෝචනය කිරීම

සහ පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ප්‍රතිපත්තියක්, සැලැස්මේ ක්‍රමෝපාය වල වෙනස්කම් සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ කිරීම.

viii. ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමැතිය දී ඇති ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම.

ix. ජාතික භෞතික නිර්මාණ සභාව සහ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින්, ඉටුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටු කිරීම ද ඇතුලුව, සභාවේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සියලු ක්‍රියාකාරකම්වලදී සභාවට සහ සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම.

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
## සංවිධාන සටහන



1.4 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විතය.

1. කලාපීය භෞතික සැලසුම් අංශය
2. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය
3. පර්යේෂණ අංශය
4. සම්බන්ධීකරණ හා නියාමන අංශය
5. වාස්තු විද්‍යා අංශය
6. ඉංජිනේරු අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

1.5 2023 වසරේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මගින් ලැබුණි

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 විශේෂ ජයග්‍රහණ - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේදී පහත සඳහන් කටයුතු සාර්ථකව නිම කරන ලදි.

1.ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතට අනුකූලව සකස්කරන ලද ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම 2019-2050 2019 ජූනි 23 දින ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලදි. ඉන්පසුව එය යාවත්කාලීන කර ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම 2048 ලෙස සකස් කර ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික භෞතික නිර්මාණ සභාවට ඉදිරිපත්කර සැලැස්මට අනුමැතිය ලබාගන්නා ලදී.

- ජාතික භෞතික නිර්මාණ සභාව විසින් දෙනු ලැබූ නිර්දේශ අනුව මහජන අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලදී.







- ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2048 ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කල අවස්ථාවේදී සැලැස්ම සියළුම දිස්ත්‍රික්

සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර ප්‍රාදේශීය නිළධාරීන් හා දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදි.

- ඒ අනුව 2023 වර්ෂය තුළ කොළඹ, රත්නපුර, හම්බන්තොට, අම්පාර, මොණරාගල හා මහනුවර යන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අවසන් කර ඇත.
- ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2048 පිළිබඳව ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කිරීම
- ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2048 ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට මැදිහත්විය හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කරන ලදි.
- ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2048 ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සම්බන්ධීකරණය, දැනුවත් කිරීම හා එම සැලැස්මේ 6 වන පරිච්ඡේදයේ (ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම) සඳහන් ආකාරයට සැලැස්ම ක්‍රියාත්මක කිරීම ස්හා අවශ්‍ය පියවර ගැනීම.

2. 2000 අංක 49 පනතින් සංශෝධිත 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ සැලසුම් ආඥාපනතේ 5(ඒ), (බී) සහ 5(සී) වගන්තියේ විධිවිධාන අනුව ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව අයත් වන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශ සඳහා කලාපීකරණ සැලසුම් සකස් කල යුතුය. ඒ අනුව 2022 වසරේදී පහත සඳහන් පළාත් සඳහා කලාපීකරණ සැලසුම් සකස් කිරීම ආරම්භ කරන ලදි.
   1. නැගෙනහිර පළාත
   2. මධ්‍යම පළාත

   2022 සහ 2023 වසර වලදී නැගෙනහිර හා මධ්‍යම පලාත් කලාපීය සැලසුම්වල පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදි.

   - මධ්‍යම හා නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැසුම් සකස්කිරීම සඳහා මධ්‍යම හා නැගෙනහිර පළාත් කලාපීය සංවර්ධන ප්‍රදේශයන් ලෙස විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම
   - කලාපීය භෞතික සැලසුම් කමිටු පත්කිරීම
   - පළාත් ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන් ඇතුලු නිළධාරීන් දැනුවත්කිරීමේ රැස්වීම් පැවැත්වීම
   - පළාතේ සියලු ආයතන දැනුවත්කිරීමේ මාර්ගගත වැඩසටහනක් පැවැත්වීම
   - කලාපීය භෞතික සැලසුම් කමිටු දැනුවත්කිරීමේ මාර්ගගත වැඩසටහනක් පැවැත්වීම
   - පළාතේ පාර්ශවකරුවන් ක්‍රියාකාරී ලෙස සම්බන්ධ කරගනිමින් කණ්ඩායම් වැඩමුළු පැවැත්වීම
   - පළාතට අදාලව ප්‍රාථමික සහ ද්වීතීක තොරතුරු රැස්කිරීම
   - ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම සඳහා අදාල දිස්ත්‍රික්කයන්හි ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම
   - රැස්කරගන්නා ලද තොරතුරු භාවිතයෙන් කලාපීය භෞතික සැලැස්ම-2035, 1කොටස (Central Province Regional Physical Plan-2035 Volume I and Eastern Province Regional Physical Plan-2035 Volume I) වන මධ්‍යම පළාතේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාව සහ නැගෙනහිර පළාතේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාව (Situation Analysis Report) සකස්කර මුද්‍රණය කිරීම
   - මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස (Central Province Regional Physical Plan –2035,Volume II) සකස්කිරීමේ කටයුතු සිදුකරමින් පැවතීම

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) සම්බන්ධව පහත සඳහන් කාර්යයන් නිම කර ඇත.

- රැස්කරන ලද තොරතුරු විශ්ලෙෂණය මගින් නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම -2035 අවකාශීය ව්‍යුහ සැලැස්ම (Spatial Structure Plan-2035) සකස්කිරීම
- ආංශික සංවර්ධන උපාය මාර්ග (Sectoral Development Strategies) සකස්කිරීම
- ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති (Action Projects) හඳුනාගැනීම
- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) වාර්තාව සකස්කිරීම සහ මුද්‍රණයකිරීම
- එම සැලැස්ම නැගෙනහිර පළාත් කලාපීය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර අදහස් හා යෝජනා ලබා ගන්නා ලදි. ඉන්පසුව 2024 වසරේදී අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

3. ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම

ලෝකයේ විවිධ රටවල් විවිධ නිර්ණායක/දර්ශක භාවිතා කරමින් නාගරික ප්‍රදේශ හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කරනු ලබයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ලෙස වර්ගීකරණය කිරීමේ දී නිර්ණායක/දර්ශක ලෙස හුදෙක්ම පරිපාලනමය ඒකක පමණක් භාවිතා කර ඇති අතර, නිල වශයෙන් මහා නගර සභා සහ නගර සභා බල ප්‍රදේශ පමණක් නාගරික ප්‍රදේශ ලෙස වර්ගීකරණය කර ඇත. එමනිසා ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ සැබෑ තත්ත්වය විදහා දැක්වීමට අසමත් වී ඇත. මෙම අවශ්‍යතාවය පිළිබඳව 1998 වර්ෂයේ දී පිහිටුවනු ලැබූ නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ වූ ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් ද නිර්දේශ කර තිබූ නමුත්, විධිමත් ලෙස ඒ සඳහා අධ්‍යයනයක් සිදු කර නොමැති නමුත්, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් මේ පිළිබඳව විවිධ අධ්‍යයනයන් සිදු කර ඇත.

ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මේ වනවිට පවතින අතර, එම වර්ගීකරණය සිදු කිරීමෙන් නාගරික සංවර්ධනය විධිමත් කළ හැකි වන අතර, එහි දිශානතිය සැලසුම් කිරීමට හා පුරෝකථනය කිරීමට හැකි වනු ඇත. උක්ත කාරණය පෙරදැරි කරගෙන ප්‍රාදේශීය සභා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම යන මැයෙන් අමප/21/2082/306/092 දරන අමාත්‍යය මණ්ඩල තීරණය ගෙන ඇත. ඒ අනුව අප දෙපාර්තමේන්තුව මගින් විවිධ ආයතන විසින් මෑතක දී මේ පිළිබඳව කර ඇති පර්යේෂණයන් ද අධ්‍යයනය කර නාගරික ප්‍රදේශ හා ග්‍රාමීය ප්‍රදේශ වර්ගීකරණය කිරීම සඳහා සුදුසු නිර්ණායකයන් හඳුනා ගනු ලබන අතර, එම නිර්ණායකයන්ට අනුමැතිය දිම උපදේශක සභාවක් මගින් සිදු කරනු ලැබේ.

අප දෙපාර්තමේන්තුව විසින් 2023 වසර තුළ මෙම කාර්යය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි

I. දත්ත විශ්ලේෂණය කිරීම තුළින් නාගරික හා නාගරික නොවන ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා සිතියම් නිර්මාණකරණය.

II. අදාළ පාර්ශවයන් වෙත විශ්ලේශන වාර්තාව සහ සිතියම් ඉදිරිපත් කිරීම.
   - ගරු නාගරික අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා වෙත ඉදිරිපත් කල අවස්ථාවේදී මෙම අධ්‍යයන ප්‍රතිඵල සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අදහස් හා යෝජනා ලබා ගන්නා ලෙසට තීරණය විය.
   - ඒ අනුව 2023 වර්ෂය තුළ කොළඹ, රත්නපුර , හම්බන්තොට , අම්පාර , මොණරාගල හා මහනුවර යන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කිරීම් සිදු කර අවසන් කර ඇත.

4. අනුරාධපුර ඇතුළුනුවර පුරා විද්‍යා රක්ෂිත තුල පදිංචිකරුවන් එම ප්‍රදේශයෙන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කර ඇතුළුනුවර පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් ඇතුළුනුවර ප්‍රදේශයේ පුරාවිද්‍යා කැණීම් සිදුකිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන අනුරාධපුර ලෝලුගස්වැව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම මේ තුලින් අනුරාධපුරයේ සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමෙ සහ ආර්ථික පුනර්ජීවනයක් ඇති කිරීම ඉලාපොරොත්තු වන අතර වඩා හොඳ ජීවන තත්ත්වයක් සහ නාගරික පහසුකම් සහතික කිරීම මගින් ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියට (NIRP) අනුකූලව ඇතුළුනුවර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම අරමුණු කරන ලදී.

ඇතුළුනුවර ඉඩම් අත්පත්කර ගැනීමේ යෝජනාව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට ප්‍රථම ඇතුළුනුවර සඳහා **"ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය"**ට (NIRP) අනුකූලව නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලෙස ඉඩම් අමාතයාංශය විසින් උපදෙස් ලබාදීම සිදු කල අතර අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති **"මහාපරිමාණ ව්‍යාපෘති ක්‍රමෝපායනය හා වේගවත් කිරීමේ"** කමිටුව විසින්ද නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙස දැනුම්දෙන ලදී.
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සතුව නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා විශේෂඥ දැනුමක් සහිත නිළධාරීන් නොමැති බැවින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාශයේ ලේකම්ගේ උපදෙස් පරිදි ඒ සඳහා තනිපුද්ගල උපදේශකයන් පත් කිරීම සඳහා අවශය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.
එමෙන්ම නාගරික සංවර්ධන හා නිවාස අමාතයාංශයේ ලේකම් විසින් ලබාදුන් උපදෙස් පරිදි මේ සඳහා මුදල් අමාතයාංශයේ විශේෂ අනුමැතිය ලබාගනැනීමට අවශ්‍ය කටුයතු සිදුකරන ලදී .
ඒ අනුව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් තනි උපදේශකයින් 09 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2023.08.07 දින අනුමැතිය ලබාදෙන ලදී.
පිරිවැය අවම කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් තමන් සතු වෘත්තිකයන් ද භාවිතා කරමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා අත්‍යාවශය පහත සඳහන් තනි පුද්ගල උපදේශකයන් මාර්ගෝපදේශ වගන්ති 4 අනුව පත් කිරීමට පියවර ගන්නා ලදී.

- ප්‍රජා සංවර්ධන විශේෂඥ (1)
- නැවත පදිංචිකිරීමේ විශේෂඥ (1)
- ජීවනෝපාය සංවර්ධන විශේෂඥ (1)
- දත්ත විශ්ලේෂණ විශේෂඥ (1)
- භූගෝලීය තොරතුරු පද්ධති විශේෂඥ (1)
- සමාජ නිළධාරීන් (4)

ඒ අනුව 2023.08.11 දින තනි පුද්ගල උපදේශකයන් සඳහා යෝජනා (RFP) කැඳවීම සිදුකල අතර ඒ සඳහා ප්‍රමාණවත් යෝජනා ඉදිරිපත් නොවූ බැවින් 2023.09.21 දින තනි පුද්ගල උපදේශකයන් සඳහා නැවත යෝජනා (RFP) කැඳවීම සිදු කරන ලදී.
ඉදිරිපත්වූ තනි පුද්ගල උපදේශකයන්ගේ තාක්ෂණික යෝජනා (Technical Proposal) ඇගයීමෙන් පසු තෝරාගත් උපදේශකයන්ගේ මූල්‍ය යෝජනා (Financial Proposal) සම්බන්ධ සම්මුඛ පරීක්ෂණය 2023.11.27 පවත්වන ලද අතර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සුදුසුකම් ලත් තනි පුද්ගල උපදේශක නාමලේඛණය අනුමත කර ඇත.

5.1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ 6(2)b හා 21(2) වගන්ති යටතේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම ද සලකා බලමින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිර්ණායක සපුරනු ලබන ආගමික සිද්ධස්ථාන පමණක් පූජාභූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඒ අනුව 2023 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ආගමික ස්ථාන පහත සඳහන් වේ.

6.ඉහත සඳහන් පරිදි ගැසට් කරන ලද පූජා භූමි සඳහා ගැසට් පත්‍රයේ නියෝගයට අනුව පරිබාහිර (වින්‍යාස) සැලසුම් සකස් කරන ලද පූජා භූමි

1. මාම්පිට වලගම්බා පුරාණ ගල්ලෙන් විහාරය
2. වේරගල ලෙනගල රජමහා විහාරය

**2023 වර්ෂයේ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ස්ථාන**

| පළාත | දිස්ත්‍රික්කය | | ආගමික ස්ථානයේ නම | ගැසට් කරන ලද දිනය | අංකය |
|---|---|---|---|---|---|
| වයඹ | පුත්තලම | 01 | තිස්සව රජමහා විහාරය | 2023.01.14 | 2314/81 |
| උතුරු මැද | පොළොන්නරුව | 02 | මහසෙන් රජ මහා විහාරය | 2023.01.14 | 2314/81 |
| බස්නාහිර | කොළඹ | 03 | බියගම සුධර්මාරාම මහා විහාරය | 2023.01.24 | 2316/18 |
| සබරගමු | රත්නපුර | 04 | මැදගොඩ සිද්ධ පත්තිනි දේවාලය | 2023.01.14 | 2314/83 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 05 | ඓතිහාසික වෙල්ගම් වෙහෙර රජ මහා විහාරය | 2023.01.14 | 2314/83 |
| බස්නාහිර | කොළඹ | 06 | පැපිලියාන සුනේත්‍රා මහාදේවි පිරිවෙන | 2023.03.17 | 2323/13 |
| වයඹ | පුත්තලම | 07 | කිරිමැටියාන සුධර්මාරාමය | 2023.04.11 | 2327/04 |
| | | 08 | පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාරය | 2023.04.28 | 2029/45 |
| මධ්‍යම | මහනුවර | 09 | මීගම්මන රජමහා විහාරය | 2023.07.27 | 2342/30 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 10 | යාන්ඔය රජමහා විහාරය | 2023.08.15 | 2345/39 |
| | | 11 | ශ්‍රී සද්ධම්ම යුක්තික වන සෙනසුන | 2023.08.15 | 2345/38 |
| | | 12 | අම්පාර මුහුදුමහා විහාරය | 2023.08.15 | 2345/37 |
| | | 13 | ශාන්ති විහාරය | 2023.08.17 | 2345/52 |
| | | 14 | සාගරපුර සමුද්‍රගිරි වන සෙනසුන | 2023.08.17 | 2345/53 |
| බස්නාහිර | කොළඹ | 15 | ගංගොඩවිල විජයාරාමය | 2023.08.09 | 2344/21 |
| වයඹ | පුත්තලම | 16 | පොතුවටවන මහා විහාරය | 2023.11.20 | 2359/05 |
| | කුරුණෑගල | 17 | කබලෑව ඇඹව ශ්‍රී සුධර්මාරාමය | 2023.12.22 | 2363/84 |
| උතුරු මැද | අනුරාධපුරය | 18 | අඹගස්වැව රජමහා විහාරය | 2023.12.22 | 2363/84 |
| බස්නාහිර | ගම්පහ | 19 | මැද්දේගම රජමහා විහාරය | 2023.12.22 | 2363/84 |

7.ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දී ඇත.

| ස්ථානයේ නම | ව්‍යාපෘතිය |
|---|---|
| කප්පින්න මහා විහාරය | කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සැලසුම් සකස් කිරීම |
| දඹාන විහාරය | ආවාස ගෙය |
| | ධර්ම ශාලාව |
| | සනීපාරක්ෂ ගොඩනැගිලි |
| | ධාතු මන්දිරය |
| | භාවනා මධ්‍යස්ථාන |
| | වන්දනා කරුවන් සඳහා විශ්‍රාම ශාලාව |
| අසිරිකන්ද රජමහා විහාරය | භාවනා මධ්‍යස්ථානයක් ඉදිකිරීම |
| | සන්නිපාත ශාලාව |
| | නවාතැන් කුටි ඉදිකිරීම |
| | ස්වාමීන් වහන්සේලාට හා මෙහෙණින් වහන්සේලාට කාමර පහසුකම් |
| | උපාසික උපාසිකාවන් සඳහා කාමර පහසුකම් |
| | සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම |
| | සූර්ය නමස්කාර පීඨිකා ඉදිකිරීම |
| මධ්‍යම තැපැල් හුවමාරුව | අභ්‍යන්තර නවීකරණ කටයුතු සිදුකිරීම |
| බුද්ධශ්‍රාවක ත්‍රිපිටක ධර්මපීඨය දඹදෙණිය | බුද්ධශ්‍රාවක ත්‍රිපිටක ධර්මපීඨය ඉදිකිරීම |
| මාලඹේ ශෛලාරාම විහාරය | ආවාසගෙය සහ විශ්‍රාම ශාලාව ඉදිකිරීම |
| මධ්‍යම තැපැල් හුවමාරුව | අභ්‍යන්තර නවීකරණ කටයුතු සිදුකිරීම |

**2.2** ඉදිරි ඉලක්ක

**2024 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු.**

1.මෙම වාර්තාවේ විශේෂ ජයග්‍රහණ යටතේ අංක 1 න් දක්වා ඇති පරිදි ජාතික භෞතික සැලැස්ම 2048 යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එහිදී 2024 වසරේදී

1. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කිරීම
   මේ යටතේ ජනවාරි මස තුළ කෑගල්ල , අනුරාධපුර, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අවසන් කර ඇත.ඒ අනුව ඉතිරි දිස්ත්‍රික් 15 අවසන් කිරීමට නියමිතය.
2. ඉන් අනතුරුව කැබිනට් අනුමැතිය ලබා ගැනීම
3. ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම
4. ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම
5. අදාල පාර්ශවකරුවන් දැනුවත් කිරීම

2.සීඝ්‍රයෙන් අවිධිමත් ලෙස සංවර්ධනය වන ජනාවාස සැලකිල්ලට ගෙන විධිමත් සංවර්ධනයකට මාර්ගෝපදේශ ලබාදීම සඳහා නැගෙනහිර හා මධ්‍යම පළාත් දෙක සඳහා කලාපීය සැලසුම් සකස් කරමින් පවතින අතර 2024 වර්ෂයේදී මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස්කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිමකිරීමට නියමිතය.

- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස (Central Province Regional Physical Plan –2035,Volume II) සකස්කිරීමට අදාලව,
  -රැස්කරන ලද තොරතුරු විශ්ලෙෂණය මගින් මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම - 2035 අවකාශීය ව්‍යුහ සැලැස්ම (Spatial Structure Plan-2035) සකස්කිරීම
  -ආංශික සංවර්ධන උපාය මාර්ග (Sectoral Development Strategies) සකස්කිරීම
  -ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති (Action Projects) හඳුනාගැනීම
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම - 11කොටස (Central Province Regional Physical Plan –2035,Volume II) වාර්තාව සකස්කිරීම සහ මුද්‍රණයකිරීම
- පනතේ විධිවිධාන පරිදි, මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලසුම් කමිටුව, තාක්ෂණ උපදේශක කමිටුව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම
- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම -2035 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) සකස්කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිමකිරීමට නියමිතය.

-පනතේ විධිවිධාන පරිදි තාක්ෂණ උපදේශක කමිටුව, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම
-නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

3.ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම 2021-2048 හි සඳහන් මධ්‍යම පාරිසරික අධිසංවේදී කලාපය සඳහා ද සැලසුම් සකස් කිරීම ආරම්භ කිරීමට යෝජිතය.

4. ප්‍රාදේශීය සභා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම

උක්ත සමීක්ෂණය හා සම්බන්ධ කටයුතු 2022 වර්ෂයෙහි ආරම්භ කළ අතර පහත කාර්යයන් 2024 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇත.

I. අධ්‍යයන ප්‍රතිඵල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අවසන් කිරීම.
   මේ යටතේ ජනවාරි මස තුළ කෑගල්ල , අනුරාධපුර, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කර අවසන් කර ඇත.ඒ අනුව ඉතිරි දිස්ත්‍රික් 15 අවසන් කිරීමට නියමිතය.
II. නාගරීකරණය සඳහා යෝජිත නිර්වචනය කමිටුව හරහා සම්මත කර ගැනීම.
III. උපදේශක සභාව වෙත ඉදිරිපත් කර අදාළ අනුමැතීන් ලබා ගැනීම.
IV. හඳුනාගත් ප්‍රදේශ ගැසට් නිවේදනයක් හරහා ප්‍රකාශයට පත්කිරීම.

5.අනුරාධපුර, ඇතුල් නුවර පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශය තුළ පදිංචිකරුවන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කිරීම සඳහා ලෝලුගස්වැව නගර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2024 වර්ෂයේ දී එම ව්‍යාපෘතියේ ඇතුල්නුවර පදිංචිකරුවන් පුනස්ථාපනය කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට බලාපොරොත්තු වේ.

6.ඉහත අංක 5 මගින් දක්වා ඇති පරිදි 2024 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි

1. ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය
2. වරකාගොඩ ගල්ලෙන් රජමහා විහාරය ගම්පහ
3. හෙයින්තුඩුව පුරාණ විහාරය ත්‍රිකුණාමලය
4. කැකිරාව ශ්‍රී දේවතිස්ස රජමහා විහාරය
5. ක්ෂේත්‍රාරාම රජමහා විහාරය
6. අතුබන්දි කඳුරුකෝට්ටේ පුරාණ රජමහා විහාරය
7. වැලිපිටමෝදර ශ්‍රී ථූපාරාම රජමහා විහාරය
8. වැවුරුකන්නල රජමහා විහාරය
9. අස්ගිරිය පුරාණ රජමහා විහාරය
10. බුද්ධියගම සිගාල රජමහා විහාරය

8. පූජා භූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ඉංජිනේරු සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම.

1. ඔලබොඩුව රජමහා විහාරය සංවර්ධන කටයුතු
2. දඹදෙනිය බුද්ධ ශ්‍රාවක ත්‍රිපිටක ධම්ම පීඨය සංවර්ධනය කිරීම
3. අනුරාධපුර මිරිසවැටිය බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා භූමි අලංකරණය
4. දැදිගම කොටවෙහෙර පන්සල සහ මංපෙත් හා සතරමහා දේවාලය ඉදි කිරීම

9. දැනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් පූජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙසම වන අතර, ඒවා පූජා භූමි ලෙසට ප්‍රකාශයට පත් කිරීම සඳහා නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය කිරීම.

10. මීට අමතරව වෙනත් ආයතන සහ පූජනීය ස්ථානවලින් කෙරෙන ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දීමට බලාපොරොත්තු වේ.

ඩබ්.ටී.එච්.රුචිර විතාන

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ඩබ්.ටී.එච්. රුචිර විතාන
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
5 වන මහල, 1 අදියර, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

# 03 පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ACA-F

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | | |
| - | ආදායම් බදු | 1 | - | - | ACA-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| 120,000,000 | භාණ්ඩාගාර අග්‍රිම | | 170,562,000 | 177,301,000 | ACA-3 |
| 1,000,000 | තැන්පතු | | 171,725 | 102,714 | ACA-4 |
| 6,800,000 | අත්තිකාරම් ගිණුම් | | 11,161,719 | 10,234,965 | ACA-5 |
| 2,000,000 | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **129,800,000** | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **181,895,444** | **187,638,679** | |
| **129,800,000** | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **181,895,444** | **187,638,679** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | - | - | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | **181,895,444** | **187,638,679** | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 127,250,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 116,770,995 | 123,125,308 | |
| 64,193,100 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 56,111,268 | 51,889,259 | ACA-2(ii) |
| 980,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 748,838 | 933,043 | |
| - | පොළී ගෙවීම් | 8 | - | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 30,000 | |
| **192,423,100** | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **173,631,101** | **175,977,610** | |
| | මූලධන වියදම් | | | | |
| 3,723,900 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,243,763 | 5,144,856 | |
| 800,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 537,246 | - | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ACA-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 717,952 | 200,000 | |
| 200,300,000 | වෙනත් මූලධන වියදම් | 15 | 2,327,920 | 2,894,352 | |
| **205,823,900** | මුළු මූලධන වියදම් (උ) | | **6,826,881** | **8,239,208** | |
| | තැන්පතු ගෙවීම් | | 128,683 | 2,734,025 | ACA-4 |
| 15,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 7,997,822 | 6,262,159 | ACA-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | | |
| **15,000,000** | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 8,126,505 | **8,996,184** | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 188,584,487 | **193,213,002** | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (6,689,043) | (5,574,323) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (6,689,043) | (5,574,323) | ACA-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ACA-3 |

1

ඒසීඒ-P

## 2023 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2023 රු. | සත්‍ය 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 254,453,030 | 211,330,784 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 22,958,580 | 26,122,477 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 277,411,610 | 237,453,261 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය සමග ශුද්ධ වත්කම් | | 22,876,337 | 26,083,276 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 254,453,030 | 211,330,784 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 82,243 | 39,201 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 277,411,610 | 237,453,261 |

පිටු අංක.....සිට .....දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .....සිට .....දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද සමඟ අවසන් ගිණුම්වලින් අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුම්වල සඳහන් සංඛ්‍යා, ඒවා අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් ශේෂ සමඟ සැසඳීම් කර ඇති බවට ද ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවට මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී | ගණකාධිකාරී නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| නම : ඩබ්.එස්.සතානන්ද | නම :ජේ.එච්.ශාමිණී සේවවන් | අධ්‍යක්ෂ (මුදල්) |
| තනතුර :ලේකම් | තනතුර :අධ්‍යක්ෂ ජනරාල් | නම :ඩී.එල්.ඩී.කුමාරි |
| දිනය :2024/02/27 | දිනය :2024/02/.. | දිනය :2024/02/26 |
| ඩබ්ලිව්.එස්. සතානන්ද<br>SLAS (SPECIAL GRADE)<br>MBA(...), PGDip... BSc (Sri Jayewardenepura)<br>ලේකම්<br>... | ජේ. එච්. ශාමිණී සේවවන්<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව<br>5 වන මහල, - ...<br>"සෙත්සිරිපාය" බත්තරමුල්ල | ඩී.එල්.ඩී. කුමාරි<br>අධ්‍යක්ෂ (මුදල්)<br>ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව<br>5 වන මහල "බී"<br>සෙත්සිරිපාය, බත්තරමුල්ල. |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

තතය

| | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 8,221,711 | 8,377,351 |
| අග්‍රිම ලැබීම් | 170,562,000 | 177,301,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 11,540,520 | 10,750,523 |
| තැන්පතු ලැබීම් | 171,725 | 102,714 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 190,495,956 | 196,531,588 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 172,725,263 | 181,229,216 |
| සහනාධාර සහ මාරුකිරීම් | 748,838 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,356,349 | 3,568,670 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 8,709,943 | 6,204,950 |
| තැන්පතු ගෙවීම් | 128,683 | 2,734,025 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 183,669,076 | 193,736,861 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 6,826,880 | 2,794,727 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | 99,625 |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | 99,625 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | 6,826,880 | 2,894,352 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 6,826,880 | 2,894,352 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (6,826,880) | (2,794,727) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | - | |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.2 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

## 3.3 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තර | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 192,840,000.00 | 192,426,100.00 | 173,631,101.00 | 90% |
| ප්‍රාග්ධන | 205,410,000.00 | 205,823,900.00 | 6,826,881.00 | 3.32% |

3.5 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - නොමැත

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 66,200,000.00 | - | |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 105,712,630.27 | - | |
| 9153 | ඉඩම් | - | 82,150,000.00 | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 390,400.00 | - | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | |
| | | | | - | |

## 3.7 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ඵුඩී/ඒ/එෆ්... | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 මැයි 22 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව**

ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වාහන අලුත්වැඩියා සඳහා අවස්ථා 02 කදී | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන | වාහනවල ධාවනයට අවශ්‍ය අමතර කොටස් |

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

| | | | |
|---|---|---|---|
| | වැය කර තිබූ එකතුව රු. 1,082,900 ක පුනරාවර්ථන වියදම් වැය විෂය අංක 311-1-1-0-1301 යටතේ දැරිය යුතු වුවත් එම වියදම මූලධන වැය විෂය අංක 311-1-1-0-2003 යටතේ වැය කර ගිණුම්ගත කර තිබුණි. එමනිසා පුනරාවර්තන වියදම් රු. 1,082,900 ක් අඩුවෙන් සහ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කල යුතු වේ. | යෙදීම සඳහා වැය කර ඇති බැවින් වැය විෂයය අංක 2003 ප්‍රාග්ධන වැය විෂයෙන් වියදම දරා ඇත. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව 2018 පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය මුදලක් අත්තිකාරම් බී ගිණුමෙහි නොදැක්වීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ මියගිය සහ විශ්‍රාමික නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 610,772 ක් අයකර නොගෙන අත්තිකාරම් බී ගිණුමෙහි දක්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

2

| | | | |
|---|---|---|---|
| (ii) | දෙපාර්තමේන්තුවේ පියදුරෙකු 2018 දෙසැම්බර් 31 දින සේවය අතහැර ගොස් තිබුණි. ඒ අවස්ථාවේදී ආපදා ණය ලෙස රු. 172,175 ක් රජයට අයවීමට තිබු නමුත් විගණිත දින වන විටත් වසර 05ක් ගත වී තිබුණි. එහි මුදල ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේත බංගලාවේ භාරකරු 2019 සැප්තැම්බර් 10 දින මුදල් අවභාවිතය හේතුවෙන් වැඩ තහනම් කර රක්ෂිත බන්ධනාගාරගත කර තිබුණු අතර ඔහුගෙන් එම අවස්ථාවේ අයවීමට තිබු රු. 183,840 ක් 2024 මැයි 15 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විදේශගත වී සිටින ඇපකරු වෙතද අදාළ මුදල පියවන ලෙස දැනුම්දී ඇත. |

(ඇ) **දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 හි 8.2 ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවට භුක්තිය ඇති ඉඩම් 06 ක් හා ගොඩනැගිලි 04 ක අයිතිය පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | කඩිනමින් මිනින්දෝරු වාර්තා ලබා ගෙන තක්සේරු සිදු කර ගිණුම් ගත කල යුතුය. | අයිතිය හිමිකර ගැනීමට කටයුතු කරමින් පවතී. අයිතිය ලැබීමෙන් පසු තක්සේරු කරනු ලැබේ. |

3

(ඈ) **නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | **නීති රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| (i) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛය | - | එකම ස්ථානයක වසර 05 ක වඩා වැඩි කාලයක් සේවය කිරීමෙන් අනිසුත් නිලධාරීන්ගේ ස්ථාන මාරුවලට බලපෑමක් සිදුවන බැවින් වහාම ස්ථාන මාරු කලයුතු බව සඳහන්ව තිබුණු නමුත් වසර 05 කට වැඩිකාලයක් සේවය කළ නිලධාරීන් 12 ක් පිළිබඳව එලෙස කටයුතු කර නොතිබුණි. | රාජකා[illegible]නීති ප්‍රකාරව කටයුතු කල යුතුය | 2023 වාර්ෂික ස්ථාන මාරු සමඟ වසර 05 ට වැඩි නිලධාරීන් ලැයිස්තුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත. |
| (ii) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය | | චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ පවතින හා පැවතිය යුතු නිපුණතා පරතරය හඳුනා ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කලයුතු වේ. එසේම චක්‍රලේඛණ 6 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | 2023/ 2024 මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකසා පුහුණු සඳහා යොමු කර ඇත. |

4

| | | |
|---|---|---|
| | වගන්තිය ප්‍රකාරව සෑම සාමාජිකයකුටම වසරකට අවම පැය 12 ක නොඅඩු පුහුණු අවස්ථා ඇති වන අන්දමින් උක්ත මානව සම්පත් සංවර්ධන සැලසුම පිළියෙල කලයුතු විය. එසේ වුවත් දෙපාර්තමේන්තුව එපරිද්දෙන් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | |

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීම වෙනුවෙන් වසර 3 – 5 අතර කාලයක සිට ජනාධිපති ලේකම් කාර්යාලයෙන්, දෙපාර්තමේන්තුවට රු. 340,200 ක් අය විය යුතු වුවද එම මුදල අය කර ගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ජනාධිපති කාර්යාලය සතුව ලිඛිත තහවුරුවක් නොමැති බව දන්වා ඇත. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් ඉල්ලා ඇත. |

5

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 08 කට වෙනත් වැය විෂයන්ගෙන් රු. 11,146,260 ක් මාරු කරගෙන තිබුණි. එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 2 ත් සියයට 153 ත් අතර ප්‍රතිශතයක් විය. වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇත. | ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී ඇති විය හැකි ඉදිරි තත්වයන් පුරෝකථනය කර ඇස්තමේන්තු පිළියෙළ කල යුතුය. | ඇස්තමේන්තු ප්‍රතිපාදන නොලැබීම හා සංශෝධිත අයවැයෙන් ප්‍රතිපාදන කපා හැරීම මත සහ අනපේක්ෂිත වියදම් ඇති වීම හේතුවෙන් වැය විෂයන් අතර මාරු කිරීම සිදු කරන ලදී. |
| (ආ) | මූලධන වැය විෂය අංක 311-1-1-1-2506 (ii) යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කල රු. 195,245,000 ක මුදලින් සියයට 100 ක්ම සංවර්ධනය කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට සෘජුවම හේතු වී තිබුණි. | ඉදිරි තත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යනයක් සිදු කර නිසි සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කල යුතුය. | පැවති ව්‍යාකූල තත්ත්වයන් නිසා භෞතික සැලසුම් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ඉතිරි වීම සිදු විය.. |
| (ඇ) | මුදල් රෙගුලාසි 66 (1) අනුව වැය විෂයයට මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විටක වෙනත් වැය විෂයයක ඉතිරිවීම් එකී වියදම් පියවීමට ලබාගත හැකි වේ. එසේ වැය විෂයයන් 04 ක් සඳහා ලබාගෙන තිබූ එකතුව රු. 5,594,961 ක් තවදුරටත් වැය නොකර ඉතිරි වී තිබුණි. එය සියයට 5 ත් 54 ත් අතර ප්‍රමාණයක් විය. | ඇතිවිය හැකි වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකළ යුතුය. | ඊකියාවෙන් ඉල්ලා අස්වීම, බඳවා ගැනීම ප්‍රමාද වීම, ඇස්තමේන්තු කළ පරිදි ගෙවීම සිදු නොවීම නිසා ඉතිරිවීම සිදුවිය. |

6

### 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2023 වර්ෂයට අදාලව 2024 වර්ෂයේ දී ගෙවා තිබූ රු. 465,164 ක බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය. | 2024 ජනවාරි 31 දක්වා සිදුකර ඇති 2023 ට අදාල වියදම් ඇතුලත් කර ඇත. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සුසැදි සුරැකි සොඳුරු බිමක් වූ අතර, මෙහෙවර වූයේ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තින් සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ ගොඩබිම සහ එහි මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන් හි ආර්ථික, සමාජීය පොදු හා පාරිසරික අංශයන් හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කලාපීය හා ප්‍රාදේශීය සැලසුම් මඟින් එම ජාතික ප්‍රතිපත්තිය හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම හා පාලනය කිරීම වේ. එසේ වුවද මෙහෙවරින් බැහැරව පූජා භූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයන් අඛණ්ඩවම යොදවා තිබුණි. මේ සඳහා | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වැය කල යුතු වේ. | මෙම කාර්යමණ්ඩලය බුද්ධ ශාසන අමාත්‍යංශයට අනුයුක්ත කරන මෙන් ඉල්ලීමක් එම අමාත්‍යංශ ලේකම් වෙත යොමු කල ද එය ප්‍රතික්ෂේප කරන ලදී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අමාත්‍යංශ ලේකම් හා බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්විය යුතුව ඇත. |

7

නගර හා ග්‍රාම නිර්මාණ පනතේ ප්‍රතිපාදන නොමැති අතර, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කල යුතු කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන බව නිරීක්ෂණය විය.

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කර 2021 ඔක්තෝබර් 31 වන විට අවසන් කලයුතු වුවත්, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්මේ සංශෝධනයන් 2023 දෙසැම්බර් 31 වන විට සිදු කර තිබූ නමුත් දිස්ත්‍රික් සංවර්ධන කමිටු 15 පමණක් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබූ අතර අවශ්‍ය දැනුවත්කිරීම් අඛණ්ඩව සිදුකර ගැසට් කර භෞතික සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ 07 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක විය යුතු අතර රට තුළ සිදු කෙරෙන භෞතික නිර්මාණ ඊට අනුකූලව සිදු වන්නේ ද යන්න සහ එසේ නොවන අවස්ථා වලදී දෙපාර්තමේන්තුව ඒ බව ප්‍රකාශයට පත් කල යුතු වේ. | 2022 ජනවාරි ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ සංශෝධනයන් සකස් කර අවසන් කර ඇත. |

8

| | | |
|---|---|---|
| (ආ) අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලොල්පුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2023 දක්වා රු.මිලියන 1,033 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් මිලියන 13.4 ක් එනම් සියයට 1 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 07 ක් ගත වුව ද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු අතරමග නවතා තිබුණි. | දෙපාර්තමේන්තුවේ විෂය පරයට අදාළ නොවන කාර්යයක් වන බැවින් අදාල පාර්ශවයන් දැනුවත් කර ව්‍යාපෘතිය සිදු කල හැකි ආයතනයක් වෙත පැවරීමට කටයුතු කල යුතුය. | ඉඩම් අමාත්‍යංශය විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉල්ලා ඇත. එය සකස් කිරීමට උපදේශකයින් නිදහස් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් තීරණයක් ගෙන නොමැත. එම ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග තීරණ කෙරේ. |
| (ඇ) 2023 වර්ෂය තුලදී මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2023 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබුණි. මේ හේතුවෙන් මෙම සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම පාරිසරික ගැටළු ඇති වීමට හේතු වී තිබුණි. | සැලසුම් කල පරිදි භෞතික සැලසුම් සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | කාර්යමණ්ඩලයේ හිඟකම නිසා මෙම සැලසුම් සකස් කිරීම සැලසුම් කළ පරිදි සිදුකළ නොහැකි විය. |

9

| | | | |
|---|---|---|---|
| (ඇ) | පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ මහා විහාර 38 ක් පූජා භූමි ලෙස ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුළ දී එම විහාර ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළයුතුය. | මෙම කාර්ය මෙම දෙපාර්තමේන්තුව සිදුකළද එය පුරාවිද්‍යා, මිනින්දෝරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන ගණනාවක් එක්ව කටයුතු කළ යුතුය. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුද ඇත. |
| (ඉ) | දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිලියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව කිරීමටත් කලාපීය සහ නගර භෞතික සැලසුම් සකස් කිරීමක් කළයුතුය. මේ සඳහා රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොමැති වීමත් ජාතික භෞතික සැලසුම ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරණ නගර නිර්මාණ සංශෝධන මගින් අවශ්‍ය සංශෝධනයක් සිදු කලත් | විශේෂඥ දැනුමැති කාර්යමණ්ඩලයක් සහ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් භෞතික සැලසුම් සකස් කිරීම සහ සංශෝධනයක් කාලීනව සිදුකළ යුතුය. | ජාතික භෞතික සැලස්ම 2019 වර්ෂයේ පිළියෙල කර සංශෝධනයක් කර අවසන් අදියරෙහි පවතී. |

10

දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 11 කට වැඩි කාලයක් ගත වුවත් ජාතික භෞතික සැලසුම් පිලියෙල කිරීම සහ අතිකුත් කලාපීය සහ නගර සැලසුම් කාලීනව පිළියෙළ කර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි.

3.3 ප්‍රසම්පාදනයන් .

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම යටතේ අනුමත කර තිබූ වියදමට වඩා රු. 2,362,923 ක් වැඩියෙන් වැයකර තිබූ අවස්ථා 05 ක් පැවති බව නිරීක්ෂණය විය | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව පිලියෙල කළයුතුය. | සැලැසුම් කරන ලද භාණ්ඩ හා සේවා සඳහා ඇස්තමේන්තුව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත. අයවැය මගින් ලද සමස්ත ප්‍රතිපාදනයම ප්‍රසම්පදාන සැලැස්මට ඇතුලත් කර නැත. |
| (ආ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික් රජයේ ප්‍රසම්පාදන පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා ප්‍රසම්පාදන ආයතන ලියාපදිංචි කිරීම, සම්බන්ධක නිලධාරියෙකු ලියාපදිංචි කිරීම (L0S), විකුණුම්කරුවන් ලියාපදිංචි කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන දැන්වීම ප්‍රකාශයට පත් කිරීම හා වෙළඳපල සැඳුම් ක්‍රමය (shopping method) ඉලෙක්ට්‍රෝන ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම සිදු | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය | ඉදිරියේදී ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රකාශයට පත් කරමින් ප්‍රසම්පාදන කටයුතු promise.lk වෙබ් අඩවිය හරහා සිදුකරමි. |

11

කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී එලෙස කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ට්‍රෝලර් ජනරාල්ගේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම වසර 05 කට වරක්ම ගොඩනැගිලි හා යන්ත්‍ර උපකරණ තක්සේරු කලයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි 04 ක් එලෙස තක්සේරු කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය අනුව කටයුතු කල යුතු වේ. | අයිතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින ඉඩම් සඳහා පමණක් තක්සේරුව ලබාගැනීමට ඇත. |
| (ආ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ලබාදී තිබූ තක්සේරු වටිනාකම රු. 5,000,000 ක් වූ හෙක්ටයාර 0.0506 ක ඉඩමක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදා නොගෙන වසර 13 ක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි. | සංවර්ධන කටයුත්තකට යොමු කළ යුතුය. | සංවර්ධන කටයුතු සඳහා රජයේ චක්‍රලේඛ වලට අදාලව අවසර ලැබීමෙන් පසු සිදුකළ හැක. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ධාවන තත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම කඩිනමින් සිදුකළ යුතු වුවත් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. | මෙම වාහන වලින් 2ක් 2024 දී අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට නියමිතය. |

12

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු රු. 7,500,000 ක් වටිනා ධාවන තත්වයේ නොපවතින වාහන 05 ක් භාවිතයට ගැනීමෙන් තොරව නිශ්කාර්යව දෙපාර්තමේන්තු භූමියේ ගාල් කර තිබුණි. | | |

### 3.5 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සියළු අංශයන්හි රු. 1,685,579ක් වටිනා පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ෆොටෝ කොපි යන්ත්‍ර හා Blueprint ඇතුළුව යන්ත්‍ර 55ක් තිබියදී 2022 වර්ෂයේදී හා 2023 වර්ෂයෙදී මුද්‍රණ වියදම් ලෙස බාහිර ආයතන වලට රු. 1,441,060 ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම වශයෙන් භාවිතා කළයුතුය. | මෙම දෙපාර්තමේන්තුව සතුව වර්ණ ඡායාරූප යන්ත්‍රයක් තිබු නමුත්, එහි තිබූ දෝෂයක් හේතුවෙන් ඉන් ලබාගන්නා පිටපත් දෝෂ සහිත විය |

## 4. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශ පත් කිරීම, ආයතනයේ කාර්ය භාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම, තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය පිළිබඳ නිලධාරීන් හඳුනා ගැනීම සිදු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අයත් තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇති |

13

| | | |
|---|---|---|
| | | අතර, එම අරමුණු සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත. |

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 133 (2) (අ) VI වගන්තිය ප්‍රකාරව වියදම් වැලැක්වීම හා අභ්‍යන්තර පාලනයේ සාර්ථක භාවය සොයා බැලීම සිදු කලයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ පරිශ්‍රය වායුසමනය කර තිබූ අතර වසර 2 ක කාලයක් තුල බඳවා නොගත් නිලධාරීන් සඳහා වෙන්කර තිබූ ප්‍රදේශ වල, විශාල AC යන්ත්‍ර 16 ක් සවිකර තිබීම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. එසේම 80 w විදුලි පහන් (ටියුබ් ලයිට්) විශාල සංඛ්‍යාවක් දිවා කාලයේ දැල්වෙන අතර, ඒ සඳහා LED තාක්ෂණය යොදා ගත හැකිව තිබුණ ද ඒ පිළිබඳව ද අවධානය යොමු කර නොතිබුණි. | වියදම් වැලක්වීමට සහ අභ්‍යන්තර පාලනයේ සාර්ථකභාවය සොයා බැලීම අභ්‍යන්තර විගණනය විසින් සිදුකළ යුතුය. | මු.රෙ. 133 (2) (අ) VI වගන්තියට අනුව, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ද, ආයතනයේ නිලධාරීන්ගේ රැස්වීම්වලදී ද, වියදම් පාලනය හා නාස්තිය සම්බන්ධවව උපදෙස් ලබා දී ඇත. |

14

6. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සැලසුම් භාරකරු ලෙස නිලධාරියකු සේවා නියුක්ත කර තිබූ අතර, ඒ සඳහා 2023 වර්ෂයේ දී වැටුප් ලෙස රු. 493,746 ක් ගෙවා තිබුණු නමුත් දෙපාර්තමේන්තුවේ සැලසුම් මුද්‍රණ අංශයේ සිතියම් හා විවිධ ලියවිලි නිසි පරිදි ලේඛනගත වී නොතිබුණි. එසේම භාවිතයෙන් ඉවත් කරන ලද සිතියම් බොහෝ ප්‍රමාණයක් තිබූ අතර, ඒවා සඳහා සුදුසු පියවරක් ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සැලසුම් අංශයේ ගබඩාවේ ලේඛන සඳහා ලේඛන සංරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | තනතුරු වලට අදාලව නිලධාරීන් වෙත කාර්යභාරයන් පැවරිය යුතුය. | සැලසුම් ගබඩා අංශයේ භාරකරු ලෙස සේවය කරන නිලධාරියාට වසර 30 ක පමණ කාලයක සිට එකතු වූ සැලසුම් 5000 ක් පමණ නැවත ලේඛන ගතකර ගබඩාව යාවත්කාලීන කළයුතුව ඇත. දැනට පවතින ලේඛන ආරක්ෂිතව ගබඩා කිරීමට ගබඩාව තුල හැකියාවක් ඇති අතර, මෙම ලේඛන සුරක්ෂිතව පවතී. |
| (ආ) | සැලසුම් අංශයේ පැරණි සිතියම් නැවත පාවිච්චි කිරීම සඳහා සැලසුම් අළුත්වැඩියාකරුවෙකු සේවයේ නියුක්තව සිටින අතර සමාලෝචිත වර්ෂයේ වැටුප් ලෙස රු. 587,400 ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවට ඵලදායික වන සුදුසු තනතුරු සඳහා අනුමැතිය ලබාගෙන බඳවා ගැනීම් සිදුකළ යුතුය. | පැරණි සිතියම් වලින් නැවත භාවිතයට ගනු ලබන්නේ 1% ක පමණ ප්‍රමාණයක් පමණි. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සැලසුම්වල ඩෙිජිටල් මුල් පිටපත් ලබා ගැනීමක් සිදු |

15

| | | | |
|---|---|---|---|
| | | | නොකරන අතර, එහි මෘදු පිටපත් පමණක් සුරක්ෂිත කර තබාගනී. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශයේ සැලසුම් මුද්‍රණය සඳහා නිලධාරී 02 නෙකු සේවයේ යොදවා තිබුණු අතර 2023 වර්ෂයේ දී වැටුප් හා වේතන ලෙස රු. 986,995 ක් ගෙවා තිබුණ ද සැලසුම් මුද්‍රණය කිරීමක් ඔවුන් විසින් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට ඵලදායික වන සුදුසු තනතුරු සඳහා අනුමැතිය ලබාගෙන බඳවා ගැනීම් සිදුකළ යුතුය. | පැරණි සැලසුම් විධිමත් කිරීමේ කාර්යය කඩිනම් කිරීම සඳහා සැලසුම් මුද්‍රිත අංශයේ එක් නිලධාරියකු යොමුකර ඇති අතර, එහි ප්‍රගතිය මාසිකව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව පුලතිසි නිකේතන බංගලා භාරකරු ලිපි ලේඛන කූට ලෙස සකස් කර මුදල් වංචාවක් 2020 වර්ෂයේ සිදුකර තිබුණි. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර අදාල මුදල් රජයට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැරදි ක්‍රියා පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදුකර අවසන් කොට චෝදනා පත්‍රයද නිකුත් කර ඇත. එකී චෝදනා පත්‍රයට දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ වැඩ තහනම් කිරීමටද පියවර ගෙන ඇත. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 291 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 165 ක් වූයෙන් පුරප්පාඩු 126 ක් විය. මෙය නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට නොහැකි වීමට | දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය පවත්වා ගත යුතුය. | භෞතික සැලැස්ම සකස් කිරීමට අදාලව සහකාර අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමේ කටයුතු අගමැති ප්‍රමුඛ කමිටුව විසින් ලබාදුන් |

16

සෘජුව බලපා තිබුණි.

අනුමැතිය මත සිදුකරමින් පවතී.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1. යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය | √ | | |
| 2. සකස් කරන ලද කලාපීය සැලසුම් | | | √ |
| 3.ප්‍රාදේශීය සහා සීමාවන්හි පිහිටි නාගරික ප්‍රදේශ හඳුනාගැනීම | √ | | |
| 4. ගැසට් කරන ලද පූජාභූමි | | | √ |
| 5. පූජා භූමි සඳහා සකස් කරන ලද විනාාස සැලසුම් | | | √ |
| 6.පූජා භූමි සඳහා තාක්ෂණික උපදේශනය ලබාදීම | √ | | |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% -49% | 50% - 74% | 75% - 100% |
| පරමාර්ථ අංක 11 අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇති කිරීම | ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම | ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| | ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම | කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන | | √ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සකස් කරන ලද **තිරසර**පරමාර්ථ අතරින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ වන පරමාර්ථය වන්නේ 11 වන පරමාර්ථය වන අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇතිකිරීම. එම අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉහත සඳහන් ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ඇත. එම ඉලක්කවලට ළඟා වීම සඳහා කලාපීය සහ ප්‍රාදේශීය සැලසුම් සකස් කළ යුතුව ඇත.මෙම වාර්තාවේ 2 පරිච්ඡේදයේ 2023 වසරේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පැවති අභියෝග යටතේ දක්වා ඇති පරිදි ප්‍රධානතම අභියෝගය වූයේ සැලසුම්කරණයට අදාලව පවතින තනතුරු පුරප්පාඩුව පැවතීමය.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 51 | 13 | 38 |
| තෘතීයික | 08 | 03 | 05 |
| ද්විතීයික | 115 | 56 | 59 |
| ප්‍රාථමික | 117 | 93 | 24 |

### 06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික හා ජ්‍යෙෂ්ඨ යන සියළු මට්ටම් සැලකූවිට දැනට සිටින්නේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 60% කටත් වඩා අඩු සංඛ්‍යාවකි. 2023 වර්ෂය සඳහා සාදන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව කලාපීය භෞතික සැලසුම් 02 ක වැඩ නිම කිරීමට බලාපොරොත්තු වුවද, මානව සම්පත් හිඟකම නිසා එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි විය.

### 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (රු.)දේශීය | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| බලපත්‍රලාභී වාස්තුවිද්‍යා පාඨමාලාව | 01 | වසරයි | 100,000.00 | දේශීය | කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීම |
| වරලත් නගර නිර්මාණ ශිල්පී විභාග පාඨමාලාව | 01 | වසරයි | 70,000.00 | දේශීය | |
| නායකත්ව කුසලතා හා පෞරුෂ සංවර්ධනය | සියලුම නිලධාරින් | පැය 06 | 33,979.00 | දේශීය | |
| ගිණුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුව | සියලුම නිලධාරින් | පැය 03 | 16,058.00 | දේශීය | |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | වසරයි | 40,000.00 | දේශීය | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම | 01 | එක් දින | 9,500.00 | දේශීය | |

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙමළ භාෂා පාඨමාලාව | 15 | පැය 150 | 15,340.95 | දේශීය | |
| නව විගණන පනත හා ගැටළු | 01 | එක් දින | 6,000.00 | දේශීය | |
| විද්‍යාත්මක සහ ආරක්ෂිත රිය පැදවීම | 05 | එක් දින | 25,000.00 | දේශීය | |
| Interactive short training course on EIA | 02 | දින 05 | 50,000.00 | දේශීය | |
| කාර්යය පටිපාටික රීති පිළිබඳ වැඩමුළුව | සියලුම නිලධාරින් | පැය 03 | 33,200.00 | දේශීය | |
| වාර්ෂි භාණ්ඩ සමීක්ෂණය | 07 | එක් දින | 70,000.00 | දේශීය | |
| පළාත්පාලන පනත් පිළිබඳ පුහුණු වැඩමුළුව | 30 | පැය 30 | 90,374.00 | දේශීය | |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව | සියලුම නිලධාරින් | පැය 03 | 18,050.00 | දේශීය | |
| අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන පිළිබඳ පුහුණුව | 01 | එක් දින | 9,500.00 | දේශීය | |
| යහපත් වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් සඳහා වන පුහුණුව | 09 | එක් දින | 45,000.00 | දේශීය | |
| ආයතන සංග්‍රහයේ විනය පටිපාටි පිළිබඳ වැඩමුළුව | සියලුම නිලධාරින් | පැය 03 | 18,250.00 | දේශීය | |
| Green associate professional training program | 01 | මාස 06 | 40,000.00 | දේශීය | |

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | | අදාල නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | අදාල නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | අදාල නොවේ | |
| 1.6 | වෙනත් | | අදාල නොවේ | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/12019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | වාහන අපහරණ කමිටුව මගින් ලබාදුන් තීරණයන් අනුව කටයුතු කිරීමට නියමිතය | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | ධාවන තත්ත්වයේ පවතින වාහන සඳහා ඉන්ධන පරීක්ෂා සිදු කර ඇත |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | | අදාල නොවේ | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | අදාල නොවේ | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | අදාල නොවේ | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |